ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ)උපාධි වැඩසටහන 2017/2018

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018

අන්තර්කරණ පන්ති කාමරවල ළමයින්ගේ ගැටළු සමඟ කටයුතු කිරීම - ESE5147/SNE5247

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.12.12 වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද , 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. දුබලතා සහිත ළමයින් සම්බන්ධව වෛද්‍ය ආකෘතියට අදාළ චින්තනයක් සමාජය තුළ පවතින බව පෙන්වීමට උදාහරණ පහක් (05) පැහැදිලි කරන්න.

02. සමහර විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත සිසුන්ට අදාළ නොවන අධ්‍යාපනයක් ලැබීම පිටුපස ඇති හේතු තුනක් (03) උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

03. අන්තර්කරණ අධ්‍යාපනය සඳහා ඇති බාධක පහක් (05) දක්වන්න.

04. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ අන්තර්කරණ අධ්‍යාපනයට අදාළ අවස්ථාවන් තුනක් (03) පැහැදිලි කරන්න.

05. වර්තමාන අධ්‍යාපන ක්‍රමය අන්තර්කරණ අධ්‍යාපනයට පහසුකම් සැලසෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඔබ සැලකිල්ලට ගනු ලබන සාධක තුනක් (03) දක්වන්න.

06. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ගේ ස්ථානගත කිරීම්වලට අදාළ තීරණවලට අදාළ ගැටළු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. විවිධත්වයකින් යුක්ත සිසුන් සමග කටයුතු කිරීමේ දී උපදේශකවරයෙකු ලෙස ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න.

08. සමහර විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ළමයින්ගේ දෙමාපියන් හට ඔවුන්ගේ ළමයින් සම්බන්ධ යථාර්තවාදී අපේක්ෂණ **(realistic expectation)** නැත."

උක්ත ප්‍රකාශය සනාථ කිරීම සඳහා නිදර්ශන දෙකක් (02) දක්වන්න.

**( ලකුණු 5 x 8 = 40)**

## 2 වන කොටස

09. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීමේ අනුපාතය සෑහීමකට පත්විය හැකි මට්ටමක තිබුණ ද තවමත් පාසල් නොයන ළමයින් කණ්ඩායම් දක්නට ලැබේ.

- **i.** පාසල් නොයන එවැනි ළමයින් කණ්ඩායම් තුනක් දක්වන්න. (ලකුණු 06)
- **ii.** උක්ත දක්වන තත්වය පිටුපස ඇති හේතු මොනවා ද? (ලකුණු 07)
- **iii.** උක්ත දක්වන තත්වයෙහි ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. (ලකුණු 07)

10. **I.** සාර්ථක අන්තර්කරණයක් සඳහා දිරි නොදෙන ශ්‍රී ලංකාවේ ජාතික මට්ටම තුළ දක්නට ලැබෙන ගැටළු මොනවා ද? (ලකුණු 10)

**II.** ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් වඩා සාර්ථක අන්තර්කරණ වාතාවරණයක් නිර්මාණය කිරීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

11. **I.** අන්තර්කරණ වාතාවරණයක් තුළ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත සිසුන්ගේ අවශ්‍යතා සැපිරීමේ දී ගුරුවරයෙකුට පූර්වයෙන් තිබිය යුතු කුසලතා පරීක්ෂා කරන්න. (ලකුණු 10)

**II.** අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී උපදේශන වාතාවරණය තුළ ගුරුවරුන් මුහුණදෙන අභියෝග මොනවා ද? (ලකුණු 10)

12. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපිය සහභාගිත්වය ආශ්‍රිතව ගුරුවරුන් මුහුණ දෙන ගැටළු මොනවා ද? (ලකුණු 10)

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය තුළ දෙමාපිය සහභාගිත්වයේ ප්‍රතිලාභ මොනවා ද? (ලකුණු 10)

13. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් හදා වඩා ගැනීමේ දී දෙමාපියභාවය තවත් එක් අභියෝගකාරී කාර්යයකි.

උක්ත දක්වන ප්‍රකාශය උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට දෙමාපිය සහයක කණ්ඩායම්වල වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

14. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට පුද්ගලානුබද්ධ අධ්‍යාපන සැළසුම්වල වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10)

II. ශ්‍රී ලංකාව තුළ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ට පුද්ගලානුබද්ධ අධ්‍යාපන සැලැස්මක් නොමැතිවීමේ ප්‍රතිවිපාක පරීක්ෂා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

00089

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF EDUCATION

BACHELOR OF EDUCATION (SPECIAL NEEDS EDUCATION)

DEGREE PROGRAMME 2017/2018

LEVEL - 05

FINAL EXAMINATION 2018

**ESE5147/SNE5247 – DEALING WITH PROBLEMS OF CHILDREN IN INCLUSIVE CLASSROOM**

**DURATION – THREE (03) HOURS**

| Date: 12.12.2018 | Time: 09.30 a.m. – 12.30 p.m. |
|---|---|

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. Explain **five (05)** instances that shows "the medical model of thinking" in the society on children with disabilities.

02. Citing examples explain **three (03)** reasons behind the inappropriate education received by some children with special educational needs.

03. State **five (05)** barriers to Inclusive Education.

04. Explain **three (03)** opportunities for inclusive education in Sri Lankan education system.

05. State **three (03)** factors that you take into consideration in restructuring current education system to facilitate inclusive education.

06. Briefly explain **three (03)** issues in relation to placement decision of children with Special Educational Needs.

07. Explain the role of a teacher as a counsellor in dealing with diverse needs of students.

08. Some parents to not have realistic expectations with regard to their children with special educational needs.
State **two (02)** instances to prove the above statement.

(5 x 4 = 40 marks)

## PART - II

09. even though the enrolment rate for the primary education at a satisfactory level in Sri Lanka, still there are groups of children who are out of the school.

i. State three (03) group of children who are not schooling. (06 marks)

ii. What are the causes behind the above situation? (07 marks)

iii. Explain the consequences of the above situation. (07 marks)

10. i. What are the problems at national level in Sri Lanka which do not foster successful inclusive practices.

(10 marks)

ii. Suggest ways and means to create better situation at national level for effective inclusive practice in Sri Lanka.

(10 marks)

11. i. Examine the pre-requisites skills possessed by a teacher to cater the needs of children with special educational needs in inclusive set up.

(10 marks)

ii. Investigate the challenges faced by teachers in instructional setting in practicing inclusive education.

(10 marks)

12. i. What are the issues faced by teachers in relation to parental involvement in education of children with special educational needs?

(10 marks)

ii. What are the benefits of parental involvement in the education of children with special educational needs?

(10 marks)

00089

13. i. Parenting is one of challengeable tasks in raising children with special educational needs.

Explain the above statement with examples.

(10 marks)

ii. Discuss the importance of parental support groups for parents and children with special educational needs.

(10 marks)

14. i. Describe the importance of Individual Education Plan (IEP) for children with special educational needs.

(10 marks)

ii. Examine the consequence of the absence of IEP for children with Special Educational Needs in Sri Lanka.

(10 marks)

*-Copyrights reserved-*